ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2370/32 - 2024 පෙබරවාරි මස 10 වැනි සෙනසුරාදා - 2024.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: RBK/LAN/AQURE/A3/84.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/11/2016/Z/364.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාවන් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 09B, යෝධගම ග්‍රාම නිලධාරි වසමට අයත් යෝධගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 610212, කලාප අංක 02, පත්‍ර අංක 02, දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි:

**කැබලි අංක 01**
ඉඩමේ නම: පුරණ අස්සැද්දුම, දංගහමුල අස්සැද්දුම; විස්තරය: කුඹුර: මුල් හිමිකම් කියන අය: ඩී. පී. ගුණපාල; ප්‍රමාණය: හෙක්. 0.0947.

**කැබලි අංක 02**
ඉඩමේ නම: පුරණ අස්සැද්දුම, දංගහමුල අස්සැද්දුම; විස්තරය: කුඹුර: මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: ප්‍රමාණය: හෙක්. 0.0353.

**කැබලි අංක 03**
ඉඩමේ නම: පුරණ අස්සැද්දුම, දංගහමුල අස්සැද්දුම; විස්තරය: කුඹුර: මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: ප්‍රමාණය: හෙක්. 0.0300.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.03.20 වැනි දින පෙ.ව. 10.00 ට රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2024.03.05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

කේ. ජී. එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්(වැ.බ.),
රඹුක්කන.

2024 පෙබරවාරි මස 05 වැනි දින,
රඹුක්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0073

1A - G 041403 - 12 (2024/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉහත සඳහන් මාතෘකාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1990/45 හා 2016.10.28 වැනි දින අංක 11-663 යටතේ ප්‍රාදේශීය ලේකම් එස්. ගුණපාලන් මහතා විසින් පළ කරන ලද නිවේදනයේ සඳහන් කර ඇති දින ඉවත් කර, ඒ වෙනුවට වෙනත් දින මාරු කරන නිසා, එම නිවේදනය පහත සඳහන් පරිදි නිවැරදි කළ යුතු බව මෙයින් දන්වා සිටිමි.

| *ඉවත් කළ යුතු දිනය හා වේලාව* | *ඉවත් කළ යුතු දින වෙනුවෙන් ආදේශක දින* |
| --- | --- |
| 2017 ජනවාරි මස 24 වැනි දින පෙ.ව. 10.00 | 2024 මාර්තු මස 27 වැනි දින පෙ.ව. 10.00 |
| 2017 ජනවාරි මස 20 වැනි දින | 2024 මාර්තු මස 20 වැනි දින |

එම්. උමාමගල්,
ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මුහුදුබඩ පත්තුව.
2024 පෙබරවාරි මස 06 වැනි දින.

EOG 02 - 0074

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.